**කළුතර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 12 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත  අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූලධන වැය රු.44,800,948 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල  රු.44,633,154 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූලධන වැය රු.167,794 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල රු.42,133 ක් වූ පොලී ආදායම වර්ෂයේ ආදායමක් වශයෙන් ගිණුම් ගත නොකොට කලින් ලද ආදායම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සභික දීමනා, දේපල ණය පොලී, වැටුප් හා වීථි ලාම්පු නඩත්තු ආධාර එකතු වටිනාකම රු.16,881,296 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.16,198,892 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් හිඟ හිටි ආදායම් රු.682,404 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් විකිණීමෙන් රු.7,185 ක ආදායමක් ලැබී ඇතත් එය ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල දේශීය ණය හා සංවර්ධන අරමුදලට අදාල පොලිය රු.428,648 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.417,554 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයට අදාල පොලී මුදල රු.11,094 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

(අ) වැය ලෙජරය අනුව වර්ෂය තුළ පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.125,000 ක් වුවත් උපලේඛන අනුව එය රු.164,458 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 4 ක ශේෂය රු.26,519,510 ක්ද, උපලේඛන අනුව ශේෂය රු.22,269,639 ක්ද විය.ඒ අනුව රු.4,249,871 ක් වැඩියෙන් දැක්වීම නිරීක්ෂණය විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදයම රු.28,476,359 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදයම රු.22,971,769 ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.5,741,430 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.2 **<u>වරිපනම් බදු</u>**

(I) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කළ ආදායම රු.8,619,459 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් අයකරගෙන තිබුණේ රු.6,016,951 ක් හෙවත් සියයට 70 ක් පමණි.

(II) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.5,668,985 ක හිඟයක් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් අයකරගෙන තිබුණේ රු.2,653,720 ක් හෙවත් සියයට 47 ක් පමණි.

2.2.3 **<u>ත්‍රී රෝද රථ නැවතුම් ගාස්තු</u>**

2015 දෙසැම්බර් 31 වන විටත් 2015 වර්ෂයට අදාල ත්‍රීරෝද රථ නැවතුම් ගාස්තු රු.240,015 ක් අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.4 **<u>ඉඩම් විකිණීම් මත බදු</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට එකක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ නොකර ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට එකක මුදල අයකර තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපොල විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 **<u>දැන්වීම් පුවරු ගාස්තු</u>**

ශ්‍රී ලංකා ජනරජයේ 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1893 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ගාස්තු අය කළ යුතු ප්‍රචාරක දැන්වීම් /නාම පුවරු 34 ක් සඳහා රු.77,665 ක් අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.6 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 111,972,112 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | |
|---|---|
| | රු. |
| උසාවි දඩ | 52,809,684 |
| මුද්දර ගාස්තු | 59,162,428 |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) සේවය හැර ගිය, මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙකු සඳහා ලබා දී තිබූ රු.386,755 ක් වූ ණය ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව නිකුත් කර මාස 6 ඉක්මවූ එකතුව රු.366,008 ක් වූ චෙක්පත් 05 ක් 2016 මැයි 30 දින වන විටත් බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණත් ඒ සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3:2 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපන කාර්යයක් සම්බන්ධයෙන් දරනු ලබන වියදම එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩි වන්නේ නම් ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ රු.97,000 ක් සමස්ථ ලංකා දහම් පාසල් සිසු නිපුනතා ඇගයීම් වැඩසටහන සඳහා සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.3 **<u>කොන්ත්‍රාත් පාලනය</u>**

2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් පැවරීමේදී, අදාල ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු වුවත් එයට පටහැනිව එකම කාලසීමාවක් තුළ සමිති 02 ක් විසින් කොන්ත්‍රාත් 04 ත්, 07 ත් අතර ප්‍රමාණයක් සිදු කර තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය